# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1991 අංක 10 දරන
# ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1991 මාර්තු මස 08 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1991 මාර්තු මස 08 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල : ශත 30 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1991 අංක 10 දරන ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1991 මාර්තු මස 8 වන දින]

එල්. ඩී.—ඕ. 24/89

1985 අංක 9 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත, 1991 අංක 10 දරන ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඩු නාමය.*

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1985 අංක 9 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනතේ 3 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි (අ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— *1985 අංක 9 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.*

"(අ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගෙන්; සහ".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියෙහි "ජාතික ආරක්ෂාව" යන වචන වෙනුවට "මුදල්" යන වචනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. *ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම*

4. 14 වන වගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 14අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතුය:— *ප්‍රධාන ප්‍රඥප්තියේ 14අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.*

*"1979 අංක 28 දරන දේශිය ආදායම් පනත, අරමුදල සම්බන්ධයෙන් අදාළ කිරීම.*

14අ. මෙම අරමුදල, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 31 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ කාර්යයන් සඳහා, ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් පිහිටුවන ලද අරමුදලක් ලෙස සලකනු ලැබිය යුතු ය.".

5. මේ පනතේ 4 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනය, 1985 මාර්තු මස 21 වන දින සිට බලාත්මක වූ ලෙස, සියලු කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතුය. *අතීතයට ද බලපෑම.*

6. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. *අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත් වල සහ පනත් වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.